# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 31 දරන
# පිරිවැටුම් බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 මැයි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 මැයි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1992 අංක 31 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1992 මැයි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 65/91

### 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1992 අංක 31 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතෙහි 48 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ඒ පනතේ 48අ වගන්තිය වශයෙන් බලසහිත විය යුතු ය :—

1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතෙහි අලුත් වගන්තියක් ඇතුළත් කිරීම.

"යන්ත්‍ර හෝ උපකරණ වෙනුවෙන් ගෙවන ලද පිරිවැටුම් බද්ද, සාදන්නකු විසින් අඩු කර ගැනීම.

48අ. (1) (මෙහි මින්මතු මේ වගන්තියෙහි "පළමුව සඳහන් සාදන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ලියාපදිංචි සාදන්නකු විසින්, 1991 ඔක්තෝබර් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් කාර්තුවක් තුළ, යම් භාණ්ඩයක් සෑදීමේ තම ව්‍යාපාරයෙහි දී පළමුව සඳහන් සාදන්නා විසින් පාවිච්චි කරන ලද යන්ත්‍ර හෝ උපකරණ වෙනුවෙන්—

(i) ඒ කාර්තුව තුළ ඇතුළත් වූ යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් (මෙහි මින්මතු මේ වගන්තියෙහි "දෙවනුව සඳහන් සාදන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් ලියාපදිංචි සාදන්නකුට පිරිවැටුම් බද්ද ඇතුළත් යම් මුදලක්, හෝ

(ii) ඒ කාර්තුව තුළ 12 වන වගන්තිය යටතේ ජ්‍යෙෂ්ඨ බදු අධ්‍යක්ෂ ජනරාල්වරයාට යම් පිරිවැටුම් බද්දක්

ගෙවා ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි එසේ ඇතුළත් කරන ලද හෝ එසේ ගෙවන ලද පිරිවැටුම් බද්ද 47 වන වගන්තියේ හෝ 48 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද ඒ භාණ්ඩ විකිණීමෙන් උද්ගත වන ඔහුගේ පිරිවැටුම සම්බන්ධයෙන් පළමුව සඳහන් සාදන්නා විසින් ගෙවිය යුතු යම් පිරිවැටුම් බද්දෙන් එසේ අඩු කරනු ලැබිය හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබිය යුතු ය :

එසේ වුවද,—

(අ) අඩු කරනු ලබන මුදල, එසේ ඇතුළත් කරන ලද හෝ එසේ ගෙවන ලද පිරිවැටුමෙන් සියයට පහක් නොඉක්මවිය යුතු ය ;

(ආ) එකී අඩුකිරීම (ඇ) ඡේදයේ විධි විධානවලට යටත්ව පළමුකොට, ඒ සෑදීම සඳහා ඒ යන්ත්‍ර සහ උප කරණ පාවිච්චි කිරීම ආරම්භ කරනු ලැබුවේ යම් කාර්තුවකදී ද ඒ කාර්තුවට ඉක්බිතිව ම එළඹෙන කාර්තුව සඳහා වූ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් ද ඉන්පසුව, ඊළඟට එළඹෙන කාර්තුව සඳහා වූ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් ද යනාදී වශයෙන් කරනු ලැබිය යුතු ය :

(ඇ) එසේ ඇතුළත් කරන ලද හෝ ගෙවන ලද පිරිවැටුම් බද්ද අඩු කිරීම—

(i) ඒ පිරිවැටුම් බද්ද, බැහැර කරනු ලැබූ භාණ්ඩ සෑදීමේ යම් ව්‍යාපාරයක හෝ 4 වන වගන්තිය යටතේ පිරිවැටුම් බද්දෙන් නිදහස් යම් ව්‍යාපාරයක පාවිච්චි කරන ලද යන්ත්‍ර සහ උප කරණ සම්බන්ධයෙන් නම් ;

(ii) අවස්ථාවෝචිත පරිදි එසේ ගෙවන ලද මුදල හෝ එසේ ගෙවන ලද පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් 46 (2) වන වගන්තියෙන් නියමිත පරිදි දෙවනුව සඳහන් සැදන්නාගෙන් වවුචරයක් හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් වවුචරයක් පළමුව සඳහන් සැදන්නා විසින් ලබාගෙන ඇත්නම් මිස ; සහ

(iii) යම් ව්‍යාපාරයක යන්ත්‍ර හෝ උපකරණ පාවිච්චි කිරීම යම් කාර්තුවක දී නතර වන්නේ නම්, ඒ කාර්තුව සඳහා ඒ පිරිවැටුම සම්බන්ධයෙන් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන්

කරනු නොලැබිය යුතු ය.

(ඇ) ලියාපදිංචි සාදන්නකු වශයෙන් නම ලියාපදිංචියට පෙරාතුව යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, එසේ ඇතුළත් කරන ලද හෝ එසේ ගෙවන ලද යම් පිරිවැටුම් බද්දක් ඒ තැනැත්තා පිරිවැටුම් බදු ගෙවීමට යටත් වන්නේ යම් කාර්තුවක් සඳහා ද ඒ කාර්තුව සඳහා ගෙවිය යුතු ඒ පිරිවැටුම සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්දෙන් පළමුවෙන් ද, පසුව එළඹෙන කාර්තු සඳහා යනාදි වශයෙන් ගෙවිය යුතු පිරිවැටුම සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්දෙන් ඉන් පසුව ද අඩු කරනු ලැබිය යුතු ය.

(2) අඩු කිරීම පළමුවෙන් කරනු ලැබුවේ යම් කාර්තුවක් සඳහා ද ඒ කාර්තුවේ සිට ගණන් බලනු ලබන කාර්තු විස්සෙන් එක් එක් කාර්තුව සඳහා (1) වන උපවගන්තියෙහි සඳහන් පිරිවැටුම සම්බන්ධයෙන් පිරිවැටුම් බද්දෙන් අඩු කිරීමෙන් පසුව (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව අඩු කරනු ලැබිය යුතු පිරිවැටුම් බද්දේ අතිරික්තය, 49 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ආපසු ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, (1) වන උපවගන්තියෙහි සඳහන් යන්ත්‍ර සහ උපකරණ මේ උපවගන්තියෙහි සඳහන් කාර්තු විස්සෙන් එක් එක් කාර්තුවේ දී (1) වන උපවගන්තියෙහි සඳහන් සෑදීමේ ව්‍යාපාරයෙහි, පාවිච්චි කරනු ලැබ ඇත්නම් මිස, කිසිම ආපසු ගෙවීමක් කරනු නොලැබිය යුතු ය.".

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.